# දිබ්බචක්ඛු ඤාණයෙන් අවධාරිත චුති-පටිසන්ධි විභාගය: විචාරාත්මක අධ්‍යයනයක්

## Cuti-paṭisandhi Examination through the Emphasis on Dibba-cakkhu knowledge: A Critical Study

ගාල්ලේ ධම්මින්ද හිමි


## Abstract

Dibba-cakkhu knowledge is one of the special knowledge ranges. The special knowledge here refers to the six types of supernormal knowledges or higher knowledges (chalabhiññā). Of these, Pubbenivāsānussati is the knowledge which is directly related to one's past lives of the saṃsāric journey. It gives the relevant Arahants the ability to penetrate on the pre-existing nature of the beings. According to the Pali Tipiṭaka, the Bodhisatta acquired this special skill of enlightenment on the first watch of the night when the mind attached to the world of form was concentrating on the Fourth Absorption. Its range extends from the commemoration of a single birth to a period within which evolution and dissolution of the world takes place (saṅvaṭṭa-vivaṭṭa kappa); a complete world cycle. The second subject of knowledge is primarily relevant to the subject of our research. That is Dibba-cakkhu or Cutūpapāta ñāṇa. On closer inspection, there is an extremely harmonious combination of Pubbenivāsānuttati ñāṇa and Dibba-cakkhu ñāṇa. That is to say, the pre-births order of the beings is inquired with the above-mentioned knowledge and passing away and re-appearing (cuti-paṭisandhi) and karmic destinations of such beings are examined by the Dibba-cakkhu. In that qualitative test, Siddhattha, the Bodhisatta discerned how they are inferior & superior, beautiful & ugly, fortunate & unfortunate and he attained this knowledge

in the second watch of the night in accordance with their kamma. This research work is fully extended to highlight the above peculiarities mentioned in the most recent sentence. It was named by the researcher as Cuti-paṭisandhi Examination. In fact, it was an examination or an investigation conducted only by the Buddha himself or by the enlightened Arahants.

**Keywords** : Dibbacakku, Cuti-Paṭisandhi, Kamma, Abiññā, Cutūpapāta-ñāṇa.

**සාරසංක්ෂේපය**

දිබ්බචක්ඛු ඥාණය යනු සුවිශේෂ ඥාණ පරාසවලින් එකකි. සුවිශේෂ ඥාණ යනුවෙන් අප අදහස් කළේ අභිඥ්ඥා සයයි. මේ අතුරෙන් ඍජුවම සත්ත්වයාගේ භව-ගමන අදාළ කරගෙන පවත්නා ඥාණ විෂය නම් පුබ්බේනිවාසානුස්සතියයි. එමගින් සත්ත්වයන්ගේ පෙර විසූ භව පටිපාටිය පිළිවෙළින් මෙනෙහි කිරීමේ ශක්‍යතාව අදාළ රහත් උතුමන්ට හිමිවේ. පාලි ත්‍රිපිටකයට අනුව රූපාවචර සිත චතුර්ථ ධ්‍යානයෙන් සමාධිගත කල්හි රාත්‍රියේ ප්‍රථම යාමයේදී බෝසතුන්ට මෙම සුවිශේෂ ඥාණ කෞශල්‍ය පහළ වී ඇත. එහි පරාසය ජාති එකක් සිහිකිරීමේ සිට සංවෘත්ත-විවෘත කල්ප දක්වා ම විහිදේ. අප පර්යේෂණය විෂයෙහි ප්‍රාමාණිකව අදාළ වන්නේ දෙවැනි ඥාණ විෂයයි. එනම් දිබ්බචක්ඛු හෙවත් චුතූපපාත ඥාණයයි. සියුම්ව බලන කල, පුබ්බේනිවාසානුස්සති ඥාණය සහ දිබ්බචක්ඛු ඥාණයේ පැනෙන අත්‍යන්ත සුසංයෝගයක් දක්නට ලැබේ. එනම්, සත්ත්වයන්ගේ පෙර විසූ කඳ පිළිවෙළින් බැලීම උක්ත ඥාණයෙන් සිදුකෙරෙන අතර එවැනි සත්ත්වයන්ගේ චුති-පටිසන්ධි තත්ත්වය පරීක්ෂා කිරීම දිබ්බචක්ඛුවෙන් සිදුකෙරෙන බැවිනි. එම තත්ත්ව පරීක්ෂාවේදී ඔවුන්ගේ චුති-පටිසන්ධිය හීනයැයිද (හීනෙ), ප්‍රණීතයැයිද (පණීතෙ), මනා වර්ණ ඇත්තේද (සුවණ්ණෙ), නොමනා වර්ණ ඇත්තේද (දුබ්බණ්ණෙ), යහපත් ගති ඇත්තේද (සුගතෙ), නොමනා ගති ඇත්තේද (දුගතෙ) ආදි වශයෙන් විමසීම පිළිබඳ ඥාණය සිද්ධත්ථ බෝසත්හු රාත්‍රියේ මධ්‍යම යාමයේ උපදවා ගත්හ. මෙම පර්යේෂණ කාර්ය පූර්ණ වශයෙන් දිගහැරෙන්නේ ආසන්නතම වාක්‍යයෙන්

දක්වන ලද ඉහත සුවිශේෂතා මතුකිරීමටයි. එය පර්යේෂකයා විසින් චුති-පටිසන්ධි විභාගය ලෙස නාමකරණය කරන ලදි. සැබවින්ම එය බුදුරදුන් හෝ අභිඥාධාරී රහත් උතුමන් විසින් ම පමණක් සිදුකළ විභාගයකි; විමර්ශනයිකි.

**යතුරුපද :** දිබ්බචක්ඛු, චුති-පටිසන්ධි, කර්ම-විෂය, අභිඥා, චුතූපපාත ඥාණය

**හැඳින්වීම**

දිබ්බචක්ඛු හෙවත් 'දිව්‍යමය ඇස' පිළිබඳ පාලි ත්‍රිපිටකයේ දීර්ඝ විස්තර හමුවේ.[1] එම සියලු මූලාශ්‍රය පරිශීලනය කිරීම උගහට බැවින් සුත්තපිටකයට පමණක් අයත් තෝරාගත් සූත්‍ර කිහිපයක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදුකිරීමට අපේක්ෂිතය. පහත දක්වන ලද පාදක සටහන් පෙන්වාදුන් මූලාශ්‍රය මගින් 'දිබ්බචක්ඛු' ඥානය පිළිබඳ දීර්ඝ විස්තර ඇතැම් තැනක හමුනොවනු ඇත. එසේ හෙයින් ඒවා 'දිව්‍යමය ඇස' පිළිබඳ දැක්වෙන කුමන හෝ මූලාශ්‍රයක් වශයෙන් ගෙන ගැඹුර පර්යේෂණ කාර්යයක නිරත වන ඕනෑම අයෙකුට ආලෝකයක් වනු ඇත.

Robert Caesar Childers (Childers, R.C., 1976: 123) පෙන්වා දෙන පරිදි දිබ්බචක්ඛු යනුවෙන් හඳුනාගත හැක්කේ දිව්‍යමය ඇස (Divine eye) හෝ අධිස්වාභාවිකඃ[2] අද්භූත, සොබාදහම ඉක්ම වූ පෙනීමක් (Supernatural vision) ආදි අර්ථවාචී විග්‍රහයකි. පාලි 'දිබ්බ' ශබ්දයේ අර්ථය විමසීමේදි ඔහු මෙම අදහස් මූලාශ්‍රය මගින් තහවුරුකරයි. ඒ අනුව 'දිබ්බ' ශබ්දයේ භාවිත අවස්ථා Childers මෙසේ දක්වයි. (Childers) එම)

| | | |
|---|---|---|
| දිබ්බං සුඛං | = | දිව්‍යමය සුවය; Celestial bliss, the leasures of the devalok (මහාවංසය) |
| දිබ්බා කාමා | = | දිව්‍යමය ප්‍රීතිය; Celestial pleasures ධම්මපදපාළි) |
| දිබ්බත්තභාවො | = | දිව්‍යමය රුව; Celestial shape, the form of a deva (රසවාහිණී) |

දිබ්බපුප්ඵානි = දෙවියන් පරිහරණය කරන ලද මල්; lowers used by the devas ධම්මපදපාළි)

දිබ්බං චක්ඛු = අධිස්වාභාවික දෘෂ්ටිය; පෙනීම; upernatural vision (ධම්මපදපාළි)

දිබ්බො = දෙවියා; a deva (අභිධානප්පදීපිකා)

දෙවරජ්ජං දිබ්බෙසු = සුරංගනාවන් අතර’ති දිව්‍යමය නීතිය; elestial rule among the angels ඛුද්දකපාඨ)[3]

**සාහිත්‍ය විමර්ශනය**

පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ට (Buddhadatta mahāthera, A.P., 1949: 144) අනුව ද දිබ්බ ශබ්දයෙන් දිව්‍යමය අර්ථයක් හැඟේ. විදුරුපොල පියතිස්ස හිමියන් (Piyatissa Thera, Widurupola, 1949: 183) විසින් ඉංග්‍රීසි divine ශබ්දයට ‘දිබ්බං, දිව්ජං, දිවියං, සොවග්ගිකං, අමානුසං, දෙවධම්මොපදෙසකො’ වැනි පාලි පද රාශියක් හඳුන්වාදෙනු ලැබේ. සුප්‍රකට PTS ශබ්දකෝෂයේ The (Pali Text Society's Pali-English Dictionary, Davids, Rhys) Stede, William, 1921: 157) දිබ්බචක්ඛු යන්නට deva-eye, the faculty of clairvoyance යන සුවිශේෂ වචන භාවිත කරයි. තවද දිබ්බචක්ඛු ඤාණයේ සීමා (limits) ලෙස බුදුරදුන්ගේ සිට අර්හත් උතුමන් දක්වා පවතින බව පෙන්වා දී ඇත. (the Buddha) ද‍ther perfect beings). දිවැස, දිබ්බ චක්ෂුස (සිරිසුමංගල හිමි, මඩිතියවෙල, 1965ඃ 303) ඤාණය උසස් ඥාන බලයන් හෙවත් අභිඥා හයෙන් සහ ත්‍රිවිද්‍යාවන්ගෙන් එකකි. (බෞද්ධ ශබ්දකෝෂය, ප්‍රේමසිරි, පී.ඩී., (පරි.), 2016ඃ 114) ඇතැම් තැනක දිබ්බ ශබ්දයෙන් සුපිරි මානුෂ චක්ෂුසයක් (the superhuman eye) ප්‍රකාශ කෙරෙන බව ද දක්වා ඇත. (පාලි ශබ්දකෝෂය (පාලි-සිංහල-ඉංග්‍රීසි), වීරසේකර, ගුණපාල, 1968ඃ 195)

අභිඥා හයෙන් සමාධියේ උපරිමයට අයත් ලෞකික අධිඥාන පහක් ද විපස්සනාව මගින් ප්‍රතිලාභ කළ හැකි, ආසවක්ඛයඃ

එනම් ලෝකෝත්තරභාවයේ උපරිමය වූ අර්හත්ව ප්‍රතිලාභයෙන් සමන්විතය. ඒවා නම්:

1. ඉද්ධිවිධ (Magical powers)
2. දිබ්බසෝත (Divine ear)
3. චෙතෝපරියඤාණ (Penetration of the minds of others)
4. පුබ්බේනිවාසානුස්සතිඤාණ (Remembrance of former xistences)
5. දිබ්බචක්ඛු (Divine eye)
6. ආසවක්ඛයඤාණ (Extinction of all cankers)

අභිඤ්ඤාවල පස්වන සුවිශේෂ අධිඥානය වන්නේ දිබ්බචක්ඛු ඤාණයයි. ත්‍රිවිද්‍යා දැක්වීමේදි දිබ්බචක්ඛුවට හිමිවන්නේ දෙවන ස්ථානයයි. අභිඤ්ඤා සය අතුරින් 4,5,6 ඤාණ විශේෂ තුන ත්‍රිවිද්‍යා නමින් හඳුනාගැනීම පහසුය. එනම්:

1. පුබ්බේනිවාසානුස්සතිඤාණ (Remembrance of former existences)
2. දිබ්බචක්ඛු (Divine eye)
3. ආසවක්ඛයඤාණ (Extinction of all cankers)

මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි (ප්‍රේමසිරි, පී.ඩී., 2016: 8) විමසන පරිදි මෙම සුවිශේෂ ඤාණ තුන අර්හත්ව ප්‍රතිලාභය සඳහා එනම් සයවන අභිඤ්ඤාව සඳහා ආවශ්‍යක සාධක නොවේ. ඔහුගේ මෙම ප්‍රකාශය විමසීමට බඳුන් කළ යුතුය. හෙතෙම එයින් අදහස් කරන්නේ බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන ත්‍රිවිද්‍යා ද යන්න විස්තර කර නොමැත. බුදුසමයේ පැනෙන ත්‍රිවිද්‍යා5 අතර අවසන් ඤාණය ආසවක්ඛයයි. ඉදින් ආසවක්ඛය ඤාණය නම් සියලු කෙලෙස් නැසීමෙන් ඉනික්බිතිව ලබන ඤාණයයි. එම ඤාණ-විෂය අර්හත්ව ප්‍රතිලාභය සඳහා ආවශ්‍යක අංගයක් නොවන්නේ කෙසේද? සමහරවිට මහාචාර්ය පී.ඩී. ප්‍රේමසිරි

උක්ත ප්‍රකාශයෙන් අදහස් කරන්නට ඇත්තේ, පුබ්බේනිවාසානුස්සති සහ දිබ්බචක්ඛු ඤාණ නොලත් අර්හත් උතුමන් පිළිබඳව ද විය හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය මුඛ්‍ය වශයෙන් කේන්ද්‍රගත වන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයටය. එහිදි ප්‍රාථමික මූලාශ්‍රය ඍජුව ඇසුරු කරමින් කෝෂග්‍රන්ථාගත නිර්වචන කෙරේද අවධානය යොමු කෙරේ. තවද දත්ත විශ්ලේෂණය කිරීමේදී විස්තාරිත ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

**සාකච්ඡාව**

දිබ්බචක්ඛුව විස්තර කිරීමේදි එම ඤාණය යථාකම්මූපග ඤාණ සහ චුතූපපාතඤාණ යන අපර නාමයන්ගෙන් ද හඳුන්වා ඇත. දිබ්බචක්ඛු විෂයෙහි පවතින සුවිශේෂත්වය වන්නේ, එමගින් ජීවීන්ගේ චුති-පටිසන්ධි විමැසීමේ ශක්‍යතාවයි. කර්මානුරූපව සත්ත්වයන්ට හිමිවන හීන, ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ වෛමත්තතා විභාගය කිරීමේ සුවිශේෂත්වය දිබ්බචක්ඛු ඤාණයට විෂයප්‍රමාණ වේ. මෙම ඤාණය පුබ්බේනිවාසානුස්සති ඤාණයෙන් වෙනස් වේ. එහිදී (පුබ්බේනිවාසානුස්සති ඤාණයෙන්) විවිධ වූ පෙර භව සිහිකර නමුත් කර්මානුරූප භව පටිසන්ධි විභාගය එනම්, සුගති, දුගති භාවය විමැසීමක් සිදු නොකෙරේ. බුදුරදුන් සතුව පැවති පුබ්බේනිවාසානුස්සති ඤාණය පිළිබඳ වටිනා සටහනකි දීඝනිකායික මහාපදාන සූත්‍රය. එහි විපස්සී බුදුරදුන්ගේ සිට ගෞතම බුදුරදුන් දක්වා සත්-බුදුවරුන් පිළිබඳ තොරතුරු හමුවේ.[6]

සුත්තපිටකයේ දීඝනිකායික මහාපදානසුත්තයේ දිබ්බචක්ඛු පිළිබඳ සටහන විමසිය යුතු එකකි. එහි විපස්සී බුදුරදුන් පිළිබඳ දැක්වීමේ දී උන්වහන්සේගේ සතුව ගිහිකල පවා පැවති දිබ්බචක්ඛු විශේෂතාවක් පිළිබඳ සටහනක් හමුවේ.

ජාතස්ස බො පන භික්ඛවෙ විපස්සිස්ස කුමාරස්ස කම්මවිපාකජං දිබ්බචක්ඛු පාතුරහොසි, යෙන සුදං සමන්තා යොජනං

පස්සති දිවා චෙව රත්තිඤ්ච. (මහාපදානසුත්ත, 2006: 30)

පෙර කරන ලද කර්මවල ශක්‍යතාව මත (owing to the results of past kamma) දිවා රෑ දෙකෙහිම සමානව බලපැවැත්වෙන (day and night alike) එසේවුවත්, යොදුනක් (a league) දුරට පමණක් දැකිය හැකි දිව්‍යමය ඇසක් විපස්සී බෝසතුන්ට හිමිව පැවතුණි. එම කර්මවිපාකජ දිවැස පිළිබඳ දීර්ඝ විස්තරයක් උක්ත සූත්‍රයේ හමු නොවේ. මෙහි සඳහන් බෝසතුන්ට විශේෂ වූ, කර්මානුකූලව ලද දිබ්බ-චක්ඛු ඤාණය සහ එය ඒ සම්බන්ධයෙන් වෙනස් මූලාශ්‍රයක් වශයෙන් ද හඳුනාගත හැකිය. අටුවාව මේ සම්බන්ධයෙන් දක්වන උපමා විස්තරය විමසා බැලීමේදී පැහැදිලි වන්නේ, කර්මවිපාක වශයෙන් ලද මෙම දිබ්බචක්ඛු ඤාණය දෙවියන්ගේ ඇස හා සමාන මසැසක් බවත්, යම්හෙයකින් නිමිත්තක් සහිතව තල ගොඩක් ඇති එක් කරත්තයකට දැමූ එක් තලැටක් නැවත කලින් දැමූ තල ඇටයමැයි දැන හැඳින ගැනීමේ හැකියාවක් පවතින්නේ යම්සේද එසේ වූ තීව්‍ර ඤාණයක් බවයි.

කම්මවිපාකජන්ති න භාවනාමයං, කම්මවිපාකවසෙන පන දවතානං චක්ඛුසදිසමෙව මංසචක්ඛු අහොසි, යෙන නිමිත්තං කත්වා තිලවාහෙ පක්ඛිත්තං එකතිලම්පි අයං සොති උද්ධරිත්වා දාතුං සක්කොති. (සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, 1918: 306).

මංසචක්ඛු (මසැස), දිබ්බචක්ඛු (දිවැස), පඤ්ඤාචක්ඛු (පැණැස) (සංගීතිසුත්ත, 2006: 368) යන ඇස් තුනෙන් පුහුදුන් සාතිශය බහුතරයක් දරාසිටින්නේ මසැසයි. එනම් භෞතික ඇසයි (Fleshy eye). පුද්ගලයාගෙන් පුද්ගලයාට පැණැස (Eye of wisdom) ද වෙනස් වේ. මුගලන් හිමියන් හා බුදුරදුන් දිබ්බචක්ඛු හා දිබ්බසෝත ඤාණ මාර්ගයෙන් දැකීම් හා ඇසීම් කාර්යයෙහි නිරත වී ඇත.[7] අභිඤ්ඤාවන්තයින් අතුරින් අග්‍රස්ථානයට පත් අනුරුද්ධ මහරහතන් වහන්සේ අභිඤ්ඤා විෂයයෙහි සුවිශේෂ මහතෙරුන් වහන්සේය. උන්වහන්සේ සතර සතිපට්ඨාන වැඩූ බැවින් හා බහුල කළ බැවින් දිබ්බචක්ඛු ඤාණය ලබා ඇත.

ඉමෙසඤ්ච පනා'හං අවුසො, චතුන්නං සතිපට්ඨානං භාවිතත්තා බහුලීකතත්තා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත

මානුසකෙන...යථාකම්මූපගෙ සත්තෙ පජානාමීති. (දිබ්බචක්ඛුසුත්ත, 2006: 82)

උන්වහන්සේ සතුව පැවති දිබ්බචක්ඛු ඤාණය කරණකොටගෙන කම් වූ පරිදි පටිසන්ධිය ලද සත්ත්වයන් දැක ඇත. (යථාකම්මූපගෙ සත්තෙ පජානාමීති). සත්ත්වයන්ගේ කර්මානුරූප චුති-පටිසන්ධි විභාගය චුතූපපාත හෙවත් දිබ්බචක්ඛු ඤාණය මගින් විග්‍රහකෙරේ.

සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ. යථාකම්මූපගෙ සත්තෙ පජානාමි: (භයභෙරවසුත්ත, 2006: 52)

බුදුරදුන් විසින් බෝසත් අවධියේ මැදියම් රැයේදී, උපදවාගනු ලැබූ දිබ්බචක්ඛු ඤාණය පිළිබඳව භයභේරව සූතුරේ විස්තර කර ඇත.

ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි. අයං ඛො මෙ, බ්‍රාහ්මණ, රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. (භයභෙරවසුත්ත, එම).

එහි විස්තර කෙරෙන පරිදි එමගින් අවිද්‍යාව නසා විද්‍යාව පහළවුණි. මෝහාන්ධකාරය නසා විජ්ජාව පහළවුණි. (''රත්තියා මජ්ඣිමෙ යාමෙ දුතියා විජ්ජා අධිගතා, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා, තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.'') තවද චතුර්ථ ධ්‍යාන පහළවීමෙන් පසුව දිබ්බචක්ඛු ඤාණය ලබා ඇත. මජ්ඣිමනිකායේ මහාසච්චක සුත්ත විග්‍රහයට අනුව ඒ ඒ ධ්‍යානවලට අනුව බෝසතුන්ගේ මනසේ ස්වභාවය මෙසේය.

ප්‍රථම ධ්‍යානය: කාමයෙන් වෙන් වූ අකුසල් දහමින් වෙන් වූ

විතර්ක සහිත, විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුඛ ඇ ස්වභාවය ("...විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං...") (මහාසච්චකසුත්ත, 2006: 584)

ද්විතීය ධ්‍යානය: විතර්කවිචාරයන් සන්හිඳීමෙන් සන්තානයේ ප්‍රසන්න බවක් ඇති, එකඟ බවින් යුත්, සමාධියෙන් හටගත් ප්‍රීතියෙන් හා සැපයෙන් යුත් ස්වභාවය ("...විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං...") (එම)

තෘතිය ධ්‍යානය: උපේක්ෂාවෙන් යුත්, සිහි ඇති, සැපැති, ප්‍රීතියට නොඇලී කයින් විඳින උපේක්ෂාමය තත්ත්වය ("පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහාසිං, සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙසිං යං තං අරියා ආචික්ඛන්ති - උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං...") (එම)

චතුර්ථ ධ්‍යානය: සැප-දුක්වලින් තොර, සෝමනස්ස-දෝමනස්ස ප්‍රහාණය කළ, උපේක්ෂාවෙන් උපන් පිරිසිදු සිහි ඇති ස්වභාවය ("සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා, පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා, අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං...") (එම)

චතුර්ථ ධ්‍යානයේදි පහළවන මනසේ පැවතීම යනු සමාහිත (concentrated), පරිශුද්ධ (pure), උපක්ලේශ රහිත (free from minor defilements), වෙනකක් සමග ගැළපිය නොහැකි (malleable), කර්මන්‍ය (workable) ස්වභාවයකි. එසේම එය මිනිස් ඇස ඉක්මවා පවතින දිව්‍යමය ඇසක් (the heavenly eye purified beyond human) වශයෙන් හඳුනාගත හැකිය. එමගින් මැරෙන උපදින (disappearing and appearing) සත්ත්වයන් දැකීමේ ඥාණයක් බුද්ධත්වයට පෙර සිද්ධාර්ථ ශ්‍රමණයන් විසින් උපදවාගනු ලැබිණි. සූත්‍ර විවරණයට අනුව චතුර්ථධ්‍යාන ප්‍රතිලාභයෙන් පසුව පිළිවෙළින් ත්‍රිවිද්‍යා උපදවා ඇත.

බුදුරදුන් සතුව පැවති චුතූපපාත ඥාණයේ විෂයීය කලාපය පෙර ද සාකච්ඡා කෙරිණි. සත්ත්වයන්ගේ කාය, වචී සහ මනෝ

කර්මවලට අදාළ දුශ්චරිත, සුචරිත සමන්විත කර්මෝපගත සත්ත්වයන් (යථා කම්මූපගෙ සත්තෙ) දැකීම චුතූපපාත ඥාණයේ ප්‍රමුඛතම කාර්යයි. (''සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි.") එවැනි සත්ත්වයන්ගේ ච්‍යුති හා උත්පත්ති දැකීම හා ඒ මගින් කර්මානුකූල භව සංචරණය පිළිබඳ බුදුහු බොහෝ අවස්ථාවල දහම් දෙසූහ. වරක් බුදුහු සුනක්ඛත්ත නම් ලිච්ඡවීපුත්‍රයාට කෝරක්ඛත්තිය නම් අචේලක පැවිද්දෙකුගේ සත් දිනකින් සිදුවීමට නියමිත මරණය ගැන හා ඔහුගේ පටිසන්ධි භවය ගැන පැහැදිලි කළහ.

යං ඛො පනෙතං සුනක්ඛත්ත මඤ්ඤසි අචෙලං කොරක්ඛත්තියංඃ සාධුරූපො අයං සමණො ති, සො සත්තමං දිවසං අලසකෙන කාලඞ්කරිස්සති..., (පාථිකසුත්ත, 2006ඃ 12)

හෙතෙම සත්දිනක් ඇවෑමෙන් අලසක නම් රෝගයක් (අජීර්ණ තත්ත්වයකි (indigestion) වැළඳීමෙන් මියයන බවත්, කාලකඤ්ජ නම් පහත් අසුරනිකායේ උපදින බවත් බුදුහු ප්‍රකාශ කළහ. තවද ඔහුගේ මෘතදේහය මිනිසුන් විසින් බීරණත්ථම්භක නම් සොහොනට ඇදදමන බව ද බුදුන් විසින් වදාරන ලදි. (''කාලඞ්කතඤ්ච නං බීරණත්ථම්බකෙ සුසානෙ ඡඩ්ඩෙස්සන්ති", (එම)

මෙම ප්‍රකාශනය බුදුරදුන් විසින් කෝරක්ඛත්තිය අචේලකයාගේ ගතිය (පටිසන්ධි භවය) පිළිබඳ කළ එකකි. බුදුන් වදාළ පරිදි, උක්ත නම් සඳහන් අචේලක පැවිද්දා සත්දිනක් ඇවෑමෙන් මරණයට පත්ව කාලකඤ්ජ නම් අසුරනිකායේ උපත ලැබුයේය. සෙසු කාරණා ද එලෙසම සිදුවුණි.

චුතූපපාත ඥාණය අතිශයින් සූක්ෂ්ම ඥාණ විශේෂයක් බව ඒ පිළිබඳ දක්වන විස්තර කථනයේදි අනාවරණය වේ.

සෙය්‍යථාපි, මහාරාජ, මජ්ඣෙ සිඞ්ඝාටකෙ පාසාදො. තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙ'පි නික්ඛමන්තෙ'පි රථියා වීථිං සඤ්චරන්තෙ'පි රථියා මජ්ඣෙ සිඞ්ඝාටකෙ නිසින්නෙපි, තස්ස එවමස්සඃ එතෙ මනුස්සා ගෙහං පවිසන්ති. එතෙ

නික්ඛමන්ති. එතෙ රථියා වීථිං සඤ්චරන්ති. එතෙ මජ්කෙධ සිඞ්ඝාටකෙ නිසින්නා'ති. එවමෙව ඛො, මහාරාජ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතුපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති:",(සාමඤ්ඤඵලසුත්ත, 2006: 144)

සූත්‍ර උපමාවට අනුව මෙම මහල් නිවාසය පිහිටා ඇත්තේ සතරමං සන්ධියෙකය. එම නිවසේ උඩු මහලේ සිටින එක්තරා ඇස් ඇති පුරුෂයෙක් (චක්ඛුමා පුරිසො)[9] හාත්පස බලයි. ඔහුට සියල්ලන්ගේ සියලු ක්‍රියාකාරකම් මනාව නිරීක්ෂණය කළ හැක්කේ, සිව්මං හන්දියේ මධ්‍යයේ සිටින්නේ යැයි හැඟීමක් දැනේ. අංගුත්තරනිකායේ ඡක්කනිපාතයේ එන මච්ඡික (මච්ඡබන්ධ) සූතුරේදී බුදුරදුන් විසින් මසුන් මරන්නෙකු (fish dealer), ගෝඝාතකයෙකු (cattle butcher), බැටළුවන් මරන්නෙකු (a butcher of sheep), සූකරිකයෙකු (a butcher of pigs), සාකුන්තිකයෙකු (a butcher of poultry), මෘගවිකයෙකු (a butcher of deer) උපමාකරගෙන භික්ෂූන්ට දේශනා කරන්නට වූයේ උක්ත වෘත්තිකයන් තම වෘත්තීය තෘප්තිය කිසිදු දිනක නොලබන බවයි. එසේවන්නේ, මරණයට පත්කරනු ලබන සතුන් කෙරෙහි වධකයාගේ වධක චිත්තයේ ද්වේෂය (one who looks on cruelly at captive animals) පදනම් කරගෙනය. එසේම මෙම ඝාතකයන් කිසිදු ඉසුරක් ද නොලබනු ඇත.

තෙ හි සො භික්ඛවෙ මගෙ වජ්ඣා වධායොපනීතෙ පාපකෙන මනසානුපෙක්ඛති. තස්මා සො නෙව හත්ථියායී හොති, න අස්සයායී, න රථයායී, න යානයායී, න භොගභොගී, න මහන්තං භොගක්ඛන්ධං අජ්ඣාවසති. (මච්ඡිකසුත්ත, 2006: 40)

දිගු කලක් අහිත පිණිස ද එසේම මරණයෙන් පසුව වුව ද නිරයට පැමිණීම සිදුවන බවයි. (තඤ්හි තස්ස භික්ඛවෙ, හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරංමරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජතීති,) මෙම සූත්‍රයේ එක්තරා පුද්ගල

කණ්ඩායමක් ඍජුව ඉලක්ක කරගෙන නැතිමුත්, සත්ත්වයන්ගේ කර්මානුකූල භව ප්‍රතිලාභය සම්බන්ධයෙන් දේශිත සූත්‍රයෙකි. සංයුත්තනිකායික සරකානි සූත්‍රයේ පැනෙන සිදුවීමෙන් ද බුදුරදුන් සතුව පැවති දිබ්බචක්ඛු ඤාණ සුවිශේෂතාව හඳුනාගත හැකිය. සරකානි කිසිදු විටෙක මරණයෙන් පසුව නිරයට, තිරිසන්යෝනියට, ප්‍රේතවිෂයයට හෝ නොපැමිණෙන බව බුදුරදුන් විසින් ඉඳුරාම වදාරන ලදි.

අයම්පි ඛො මහානාම, පුග්ගලො අගන්තා නිරයං, අගන්තා තිරච්ඡානයොනිං, අගන්තා පෙත්තිවිසයං, අගන්තා අපායංදුග්ගතිං විනිපාතං. (දුතියසරකානිසුත්ත, 2006ඃ 198)

මෙලෙස දිබ්බචක්ඛු ඤාණය විෂයෙහි පවතින සුවිශේෂ විෂය පරාසයක් ලෙස මැරෙන-උපදින සත්ත්වයින්ගේ භව පටිසන්ධිය හඳුනාගත හැකිය. තෙසැත්තෑඤාණ අතුරින් 54වන ඤාණය දිබ්බචක්ඛුවයි. මේ පිළිබඳව අවැසිනම් පටිසම්භිදාමග්ගයේ, ඤාණකථාවල දිබ්බචක්ඛු ඤාණයට අදාළව විමසිය හැකිය.[10]

**නිගමනය**

අවසන් වශයෙන් මෙම ලිපියේ විවරණය වශයෙන් පටිසම්භිදාමග්ගයේ ම එන පහත ප්‍රකාශනය උපුටා දක්වමි.

"තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. (පටිසම්භිදාමග්ග 1, ඤාණකථා, 2006ඃ 216)

දිබ්බචක්ඛු යනු ඤාණාර්ථයෙන් ඤාණයක් වශයෙන් ද ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥාව වශයෙන් ද හඳුන්වා දිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

**ත්‍රිපිටක මූලාශ්‍රය**

දීඝනිකාය 1. (2006). බු.ජ.මු.

දීඝනිකාය 2. (2006). බු.ජ.මු.

දීඝනිකාය 3. (2006). බු.ජ.මු.

මජ්ඣිමනිකාය 1. (2006). බු.ජ.මු.

සංයුත්තනිකාය 2. (2006). බු.ජ.මු.

සංයුත්තනිකාය 5-2. (2006). බු.ජ.මු.

අඞ්ගුත්තරනිකාය 4. (2006). බු.ජ.මු.

මහාථෙර, සිරිදේවමිත්ත ධම්මකිත්ති. (1918). සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, පඨමො භාගො, හෙයියන්තුඩුවේ, (සංස්.), සයිමන් හේවාවිතාරණ භාරය, කොළඹ: ත්‍රිපිටක ප්‍රකාශන.

## කෝෂ ග්‍රන්ථ

Buddhadatta mahāthera, A.P. (1949). Concise Pāli-English Dictionary. New Delhi: Motilal Banarasidas Publishers Pvt. Ltd.

Childers, R.C. (1976). Dictionary of the Pali Language. Kyoto: Rinsen Book Company.

Piyatissa Thera, Widurupola. (1949). The English-Pāli Dictionary. Colombo: The Colombo Apothecaries Company, Ltd.

Davids, Rhys & Stede, William. (1921). The Pali Text Society's Pali-English Dictionary, London: PTS.

වීරසේකර, ගුණපාල. (1968). පාලි ශබ්දකෝෂය (පාලි-සිංහල-ඉංග්‍රීසි). කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සිරිසුමංගල හිමි, මඩිතියවෙල. පාලි-සිංහල ශබ්දකෝෂය. (1965). ප්‍රකාශන ආයතනයක් සඳහන් නොවේ.

ප්‍රේමසිරි, පී.ඩී. (පරි.). බෞද්ධ ශබ්දකෝෂය. (2016). මහනුවර: බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.